# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

## 11 ශ්‍රේණිය ප්‍රථම වාර පරීක්ෂණය – 2019 මාර්තු

### තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය – I පත්‍රය පැය එකයි

**සටහන:**

*(i) ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.*

*(ii) **1** සිට **40** දක්වා ප්‍රශ්න සඳහා **වඩාත් සුදුසු හා නිවැරදි පිළිතුර**, දී ඇති පිළිතුරු (1), (2),(3), (4) අතරින් තොරන්න.*

1. 'පන්තියක එක් එක් සිසුවා ගණිතය විෂයට ලබාගත් **ලකුණු** රැස්කර එහි **සාමාන්‍ය ලකුණ** ගණනය කිරීමට පන්තිභාර ගුරුතුමිය විසින් සිසුන්ට පවසයි.'
තද කළු අකුරුන් මුද්‍රිත වචන වලින් පිළිවෙලින් දැක්වෙන්නේ,

(1) දත්ත හා තොරතුරු
(2) තොරතුරු හා දත්ත
(3) දෙකම දත්තයන් වේ.
(4) දෙකම තොරතුරු වේ.

2. නශ්‍ය මතකයක් නොවන්නේ,
(1) වාරක මතකය (cache memory)
(2) මතක කාඩ්පත් (memory card)
(3) සසම්භාවී පිවිසුම් මතකය(RAM)
(4) මතක රෙජිස්තර (memory registors)

3. පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

A - මතක රෙජිස්තර ධාරිතාවය දෘඩ තැටියේ ධාරිතාවයට වඩා අඩුය.

B - මතක රෙජිස්තරවල දත්ත ප්‍රවේශ කර ගැනීමේ වේගය දෘඩ තැටියේ දත්ත ප්‍රවේශ වේගයට වඩා අඩුය.
C - මතක රෙජිස්තරවල දත්ත තැම්පත් කිරීමේදී බිටුවක් සඳහා වැයවෙන මුදල දෘඩ තැටියේ දත්ත තැම්පත් කිරීමේදී බිටුවක් සඳහා වැයවෙන මුදලට වඩා වැඩිය.

ඉහත ප්‍රකාශ ඇසුරින් සත්‍ය වන්නේ,

(1) A හා B පමණි.
(2) A හා C පමණි.
(3) B හා C පමණි.
(4) ඉහත සියල්ල.

4. පෞද්ගලික පරිගණයක මධ්‍ය සැකසුම් ඒකකයේ (CPU)කොටස් වන්නේ,
(1) මතකය, පාලන ඒකකය, සහ අවයනය
(2) පාලන ඒකකය, අංක ගණිතමය හා තර්කන ඒකකය(ALU) සහ සසම්භවී පිවිසුම් මතකය(RAM),
(3) පාලන ඒකකය, අංක ගණිතමය හා තර්කන ඒකකය(ALU) සහ මතක රෙජිස්තර
(4) පාලන ඒකකය, අංක ගණිතමය හා තර්කන ඒකකය(ALU) සහ වාරක මතකය (Cache memory)


5. පරිගණක දෙකක් අතර සම්බන්ධතාවය ගොඩනැගීමට භාවිතා කරන උපාංගය වන්නේ,

(1) ප්‍රකාශ අක්ෂර සංජානනය (OCR)
(2) චුම්බක තීරු අනුලක්ෂණ කියවනය(MICR)
(3) අනවරත බල සැපයුම (UPS)
(4) ජාලකරණ අතුරු මුහුණත් කාඩ්පත (NIC)

6. $90_{16}$ ට තුල්‍ය වන්නේ,

(1) $10010000_2$
(2) $5A_{16}$
(3) $1011100_2$
(4) $90_{10}$

7. පහත දැක්වෙන තාර්කික පරිපථයේ ප්‍රතිදානය වන්නේ,




(1) A .(B+C) (2) A + (B+C) (3) A. (B.C) (4) A. (B+C)

8. පහත සඳහන් ප්‍රකාශන අතරින් සත්‍ය වන්නේ,

(1) 1KB=8bytes (2) 1MB=8KB (3) 1KB=1024 bytes (4) 1MB=1024 Bytes

9. පද්ධති මෘදුකාංග පිලිබඳ පහත සඳහන් ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ,

A- Ubuntu සහ Mac පද්ධති මෘදුකාංග දෙකකි.

B- දෘඩාංග ඒකාබද්ධ කිරීම කලමනාකරණය කිරීම මෙහි වගකීම වේ.

C- දෘඩාංග හා යෙදුම් මෘදුකාංග අතර අන්තර්ක්‍රියා කිරීමට උපකාරී වේ.

(1) A හා B පමණි. (2) A හා C පමණි.
(3) B හා C පමණි. (4) ඉහත සියල්ල.

10. මෙහෙයුම් පද්ධතියක මතක කළමනාකරණයේ කාර්ය වන්නේ,

(1) ක්‍රියාවලි අවසානයේදී මතකය නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

(2) දෘඩ තැටියට ප්‍රවේශ වීම.

(3) ගොනු හා ෆෝල්ඩර සංවිධානය කිරීම

(4) උපාංග කළමනාකරණය කිරීම

11. තරු ආකාරයේ පරිගණක ජාලයකදී ,

(1) පරිගණකයට කේබල රාශියක් සම්බන්ධ කරයි.

(2) සියලුම පරිගණක මධ්‍යයේ ඇති එක් උපාංගයකට සම්බන්ධවේ.

(3) සියලුම පරිගණක එක් ප්‍රධාන වයරයකට සම්බන්ධ වේ.

(4) පරිගණක සංවෘත කාණ්ඩය ලෙස පෙළ ගැස්වී ඇත.

12. $1445_8$ ට තුල්‍ය වන්නේ,

(1) 001111101001 (2) 001100100101 (3) 1010011001000 (4) 00110010011

13. $32_{16}$ ට තුල්‍ය වන්නේ,

(1) $11001_8$ (2) $101010_2$ ( 3) $62_8$ (4) $74_8$

14. දශමය 235 ට තුල්‍ය BCD අගය වන්නේ,

(1) 001111101001 (2) 001100100101 (3) $101011001000_2$ (4) 001000110101

15. ASCII කේත ක්‍රමයේදී $1000010_2$ මගින් B අක්ෂරය නිරූපණය කරයි නම්, E මගින් නිරූපණය කෙරෙන ASCII කේතය වන්නේ,

(1) $10000001_2$ (2)$1000100_2$ (3)$100001010_2$ (4) $1000101_2$

16. වදන් සැකසුමේදී Portrait සහ Lanascape මගින් දක්වන්නේ,

(1) Page Orientation (2) Paper Size (3) Page Layout (4) Margin

17. දීර්ග ලේඛනයක විවිධ ස්ථානවල ඇති වචනයක් සොයා ගැනීමට වදන් සැකසුම් මෘදුකාංගයක ඇති පහසුකම වන්නේ,

(1) Cut and paste (2) Copy and paste (3)Find and Replace (4) Spellings and Grammar

18. යතුරුලියනයක් භාවිතයට වඩා වදන්සැකසුම් මෘදුකාංගයක් භාවිතා කිරීම ජනප්‍රිය වීමට හේතු වන්නේ,

A- පහසුවෙන් නැවත සංස්කරණය කලහැක.

B - අක්ෂර වින්‍යාසයේ දෝෂ සෙවීම පහසුවෙන් කලහැක.

C- ලේඛනයට රූප එකතුකල හැක.

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) ඉහත සියල්ල.

19. $CO_2$ ලිවීමේදී භාවිතාවන පහසුකම වන්නේ,

(1) Increase Font size (2) Decrease Font size (3) Superscript (4) Subscript

20. ලේඛනයකට ශිර්ෂකයක්(Header) හා පාදකයක් (Footer) ඇතුලත් කිරීමේ අරමුණ වන්නේ,

(1) ලේඛනයේ සමස්ත පෙනුම වැඩි කිරීම

(2) පිටුවක අරම්භය හා අවසානය සටහන් කිරීම.

(3) විශාල ලේඛනයක් පහසුවෙන් කියවිය හැකි වීම

(4) ලේඛනය වඩාත් විධිමත් හා සන්විධානාත්මක වීම.

21. පැතුරුම්පත් මෘදුකාංග සඳහා උදාහරණ වන්නේ,

A. Microsoft Excel B. OpenOffice.org Calc C. Fedora

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) ඉහත සියල්ල.

22. කෝෂ ලිපිනයකට $ යෙදීමෙන් සිදුවන්නේ, (eg. $E$2:$B$10)

(1) නිරපේක්ෂ කෝෂ ලිපිනයක් නිර්මාණය වේ.

(2) තවත් කෝෂයකට පිටපත් කිරීමේදී කෝෂ ලිපින වෙනස් වේ.

(3) Sheet Tabs වෙනස් වේ.

(4) තත්ත්ව තීරුව මගින් කෝෂ ලිපින නොපෙන්වයි

❖ 10 ශ්‍රේණියේ ICT හදාරණ සිසුන් විසින් ලබාගත් වාර පරීක්ෂණ ලකුණු ඇතුලත් පැතුරුම්පත් කොටසක් පහත දැක්වේ.

| | E | F | G |
|---|---|---|---|
| 10 | **Student Name** | **Term 1** | **Term 2** |
| 11 | M.M.Soysa | 56 | 64 |
| 12 | R. Kumarage | 80 | 72 |
| 13 | D. Silva | 65 | 59 |
| 14 | | | |
| 15 | | | |

23. පළමු වාර පරීක්ෂණය සඳහා සිසුන් ලබාගත් වැඩිම ලකුණ සෙවීමට F15 කෝෂයට ඇතුලත් කළයුතු ශ්‍රිතය කුමක්ද?

(1) =MAX(G11:G13) (2) =MAX(F11:F13) (3) =MIN(F11:F13) (4) =COUNT(G11:G13)

24. පළමු වාර පරීක්ෂණය සඳහා සිසුන් ලබාගත් ICT ලකුණුවල සාමාන්‍ය සෙවීමට F14 කෝෂයට ඇතුලත් කළයුතු ශ්‍රිතය කුමක්ද?

(1) =AVARAGE(G11:G13) (2) =AVERAGE(F11:F13)
(3) =AVG(F11:F13) (4) =G11+G12+G13/3

25. දත්ත පාදකයක ප්‍රධානම අංගය වන්නේ,

A. Table B. Query C. Form D. Index

(1) A ,B හා C පමණි. (2) A ,B හා D පමණි.
(3) C හා D පමණි. (4) ඉහත සියල්ල.

26. දත්ත පාදකයක කේෂ්ත්‍ර (Field) කිහිපයක එකතුව,

(1) record (2) table (3) query (4) Form

27. දත්ත පාදක වගුවක පේලි (row), රෙකෝඩ (record) ලෙස හඳුන්වන අතර තීරු (Columns) හඳුන්වන්නේ ............. ලෙසය.

(1) Labels (2) Fields (3) Data types (4) Cells

28. ජාතික හැඳුනුම්පත් අංකය දැක්වීම සඳහා සුදුසුම දත්ත වර්ගය (data type ) වන්නේ,

(1)Text (2) Number (3) Memo (4) OLE Object

29. වගුවක රෙකෝඩ අනන්‍යව හඳුනාගත හැකි තීරුවක් හෝ තීරු සංයෝජනයක්......................... ලෙස හැඳින්වේ.

(1) Record (2) Primary Key (3) Lables (4) Cell

30. විද්‍යුත් පැතුරුම්පතකට නව කදාවක් (new slide) ඇතුලත් කිරීමට භාවිතා කල හැකි කෙටි මං යතුර (shortcut key) වන්නේ,

(1) Ctrl+X (2) Ctrl+M (3) Ctrl+S (4) Ctrl+N

31. විද්‍යුත් සමර්පනයක් ප්‍රේක්ෂකයාට ඉදිරිපත් කිරීම සඳහා (slide show) යොදා ගතහැකි යතුර (key) වන්නේ,

(1) F1 (2) F4 (3) F5 (4) F6

32. පහත දැක්වෙන ව්‍යාජ කේතයේ ප්‍රතිදානය වන්නේ,


```
Begin
        X=100
        While x>95 do
                Print x
                X=x-1
        End While
        Print x
End
```

(1) 100,99,98,97,96

(2) 100,99,98,97,96,95

(3) 99,98,97,96,95

(4) 99,98,97,96




33. පහත දැක්වෙන ගැලීම් සටහනේ පාලන ව්‍යුහයන් පිලිවෙලින් දැක්වෙන්නේ කුමන පිලිතුරේද?

(1) Selection, Repetition

(2) Selection, Repetition, Sequence

(3) Sequence, Repetition

(4) Selection, Sequence

34. මෙම ගැලීම් සටහනේ ප්‍රතිදානය වන්නේ,

(1) 9 (2)12 (3) 8 (4) 16

35. පහත දක්වා ඇති ‘while’ සහ ‘repeat until’ ලූප(loops) සලකන්න.

| | |
|---|---|
| count_x = 1<br>while count_x <=10<br>    count_x = count_x+2<br>end while | count_y =1<br>repeat<br>  count_y = count_y+2<br>until count_y <=10 |

while හා repeat until යන ලූප දෙක ක්‍රියාත්මක වීම සම්පූර්ණ වූ විට count_x සහ count_y හි අගයයන් පිළිවෙළින් කුමක්ද?

(1) 9 සහ 9 (2) 9 සහ 11 (3) 11 සහ 9 (4) 11 සහ 11

36. පහත ව්‍යාජ කේතය සඳහා නිවැරදි ප්‍රතිදානය තෝරන්න.

```
x=5
y=(x*2)+10
While (y>5) do
        Print y+2
        y=y/2
print x
```

(1) 20 10 5 (2) 22 12 5 (3) 22 12 10 (4) 22 13 7.5 5

37. පැස්කල් ක්‍රමලේඛන භාෂාවට අයත් නොවන දත්ත ප්‍රරූපය දක්වන්න.

(1) Real (2) Char (3) Boolean (4) Float

38. පැස්කල් ක්‍රමලේඛන භාෂාවට සුදුසු විචල්‍යක් වන්නේ,

(1) exports (2) Student ID (3) &Total (4) Last_name

39. පැස්කල් ක්‍රමලේඛන භාෂාවට අයත් නොවන ඇවුරුනු පදයක් වන්නේ,

(1) String (2) mod (3) case (4) Average

40. පැස්කල් ක්‍රමලේඛන භාෂාවේ කාරක රීති අනුව පහත සඳහන් ප්‍රකාශනයේ ප්‍රතිදානය වන්නේ,

NOT (16 mod 4 >6)

(1) True (2) False (3) 0 (4) Not True

# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
## පළමු වාර පරීක්ෂණය - 2019 මාර්තු
## 11 ශ්‍රේණිය   තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය II

**කාලය පැය 02**

සටහන: පළමු ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක්ද ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් හිමි වන අතර අනෙකුත් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමිවේ.

**(1)**

(i) a. දෙවන පරම්පරාවේ පරිගණකවල භාවිත වූ දෘඩාංග තාක්ෂණය කුමක්ද?

b. දෙවන පරම්පරාවේ පරිගණක සහ තෙවන පරම්පරාවේ පරිගණක අතර වෙනස්කම් දෙකක් ලියන්න.


(ii) a. අධ්‍යාපන ක්ෂේත්‍රයට ICT උපකාරී වන ආකාර 04 ක් දක්වන්න.

b. තොරතුරුවල ලක්ෂණ 04 ක් දක්වන්න.

(iii) a. $4BF_{16} + 3456_8$ ප්‍රකාශය ගණනය කර දශමය ආකාරයෙන් දක්වන්න.

b. $502_8$ යන අෂ්ටමය සංඛ්‍යාව ද්විමය සංඛ්‍යාවක් බවට හරවන්න.(පියවර ලියා දැක්විය යුතුය.)

(iv) පහත තාර්කික පරිපථයේ ප්‍රතිදානය (F) ලියා දක්වන්න.




(v) A හා B තීරු යා කරන්න.

| A | | B | |
|---|---|---|---|
| 1 | යතුරු පුවරුව (Key board) | A | Video Port |
| 2 | මුද්‍රණයන්ත්‍රය (Printer) | B | PS/2 Port |
| 3 | මර්ගකය (Router) | C | Parallel Port |
| 4 | පරිගණක තිරය (Monitor) | D | Network Port(RJ 45) |

(vi) පරිගණක පද්ධතිවල භාවිතා වන කේතක්‍රම දක්වන්න.

(vii) පහත දැක්වෙන ව්‍යාජ කේතයට සංඛ්‍යාවක් ලබා දුන් විට එය ඔත්තේ සංඛ්‍යාවක්ද(odd number) ඉරට්ටේ සංඛ්‍යාවක්ද(even number) යන්න දක්වයි. හිස් තැන් පුරවන්න.

```
Begin
        Input X
        IF X mod ………. =   0  Then
                …………… "X is  even number"
        Else
                Print     "X is  ……….. number"
        ……………
End
```

(viii) ඡේදය කියවා පිළිතුරු සපයන්න.
මාලන් ඔහුගේ සුහුරු දුරකථනය (smart phone)සහ bluetooth ස්පීකරය භාවිතයෙන් රූපවාහිනී සංගීත වැඩසටහනක් නරඹයි.
a. ඉහත සිද්ධියට අදාල දත්ත සම්ප්‍රෂණ මාධ්‍ය (transmission medium) කුමක්ද?
b. ඉහත සිද්ධියට අදාල දත්ත සම්ප්‍රෂණ විධිය (mode of transmission )කුමක්ද?

(ix) A හා B තීරු ගලපන්න.

| | A | | B |
|---|---|---|---|
| 1 | පරිගණකයට විදුලිය සැපයීමත් සමග එහි පර්යන්ත උපාංග පරික්ෂා කරනු ලබන මෘදුකාංගයයි | S | Disk defragmentation |
| 2 | විධාන පේළි අතුරු මුහුණතක් ඇති මෙහෙයුම් පද්ධතියකි. | T | Format |
| 3 | ගොනු ආකෘතියක් භාවිත කරමින් ආචයන මාධ්‍ය දත්ත තැම්පත් කල හැකි ආකාරයට පත් කිරීම. | U | BIOS |
| 4 | දෘඩ තැටියේ ඇති ගොනු නැවත සංවිධානය කරන ක්‍රමවේදයකි. | V | DOS |

(x) පරිගණක ජාල භාවිතයේ වාසි 2 ක් ලියන්න

**(2)** "Tech Zone" පරිගණක කොටස් අලවි කරන වෙළඳ ආයතනයකි. එම ආයතනයේ දත්ත සමුදායට අයත් වගු කිහිපයක් පහත දැක්වේ.

මිලදී ගැනීම් වගුව **Purchase Table**

| Date | Supp_ID | Item_ID | Count |
|---|---|---|---|
| 20/01/2019 | S01 | B001 | 40 |
| 29/01/2019 | S03 | B004 | 20 |
| 12/02/2019 | S02 | B002 | 30 |
| 25/02/2019 | S04 | B003 | 15 |
| 14/02/2019 | S02 | B001 | 20 |

සැපයුම්කරුවන්ගේ වගුව **Supplier Table**

| Supp_ID | Supp_ Name | Phone No |
|---|---|---|
| S01 | Tech Lanka | 0352225456 |
| S02 | IT Zone | 0112857832 |
| S03 | City Smart | 0412256453 |
| S04 | Tech Park | 0112564875 |

අයිතම වගුව **Item Table**


| Item_ID | Item Name | Stock |
|---|---|---|
| B001 | 19'' LED Monitor | 15 |
| B002 | 1TB Hard Disk | 20 |
| B003 | 16 GB USB Flash Drive | 15 |
| B004 | 1Tb RAM | 20 |

(i) ප්‍රාථමික යතුරු (primary key)දෙකක් අදාල වගු සමග ලියා දක්වන්න
(ii) අවිශ්ක "Tech Zone" ආයතනය වෙත ගොස් 16GB සැණෙලි මතක (16GB USB flash Drives) පහක් මිලදී ගත්තේය.
a. යාවත්කාලීන විය යුතු වගුව/වගු මොනවද?
b. යාවත්කාලින විය යුතු රෙකෝඩ වගු නාම සහිතව ලියා දක්වන්න.

(iii) "Tech Zone" ආයතනය විසින් optical mouse නම් නව අයිතමයක් එකතු කිරීමට තීරණය කරන ලදුව, ඒවායින් ඒකක 40ක් Tech park නම් සැපයුම් ආයතනයෙන් 2019/02/28 දින මිලදී ගනී.

a. යාවත්කාලීන විය යුතු වගුව/වගු මොනවද?
b. යාවත්කාලින විය යුතු රෙකෝඩ වගු නාම සහිතව ලියා දක්වන්න.
(iv) මෙම දත්ත සමුදාය ආරක්ෂා කිරීමට භාවිත කල හැකි ක්‍රම දෙකක් ලියන්න.

**(3)** පහත දැක්වෙන්නේ මහානාම විද්‍යාලයේ පරිගණක සංගමය විසින් සකසන ලද දැන්වීමකි. ඔවුන් මෙම දැන්වීම සකස් කිරීම සඳහා වදන් සැකසුම් මෘදුකාංගයක් භාවිතා කර ඇත.




(i) a. මෙම ලේඛනය desktop මත 'ICT CLUB' ලෙස සුරැකීමට (save) අදාල පියවර ලියා දක්වන්න.
b. A ලේබලයේ පරිදි හැඩසවු කිරීමට භාවිත කල හැකි මෙවලම කුමක්ද?
c. B, C, D ලේබල වලින් දක්වා ඇති මෙවලම් දක්වන්න.
d. ඉහත සඳහන් පරිදි පාසල් වෙබ් අඩවියට අධි සන්ධානයක් (Hyperlink) නිර්මාණය කිරීමට අදාල පියවර ලියා දක්වන්න.

(ii) a. ගුණාත්මක ඉලෙක්ට්‍රොනික් සමර්පණයක(presentation) අඩංගු විය යුතු ලක්ෂණ පහක් ලියන්න
b. ඉලෙක්ට්‍රොනික් සමර්පණ(presentation) මෘදුකාංගවල භාවිත වන දසුන් වර්ග (views types) මොනවද?

**(4)**

(i) දුරස්ථ සෞඛ්‍ය රැකවරණය (Tlimedicine) තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ එක් වාසියකි.
දුරස්ථ සෞඛ්‍ය රැකවරණය (Tlimedicine) යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? දුරස්ථ සෞඛ්‍ය රැකවරණය භාවිත කරන අවස්ථා දෙකක් ලියන්න.

(ii) පාසලේ පරිගණක දෘඩාංග කණ්ඩායමේ සාමාජිකයෙක් පවසන්නේ පංගු බෙදීම (partitioning) මෙහෙයුම් පද්ධතියක උපයෝගිතා මෘදුකාංගයක වැදගත් කාර්යයක් බවයි.
පංගු බෙදීම (partitioning)යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? එය සිදු කරන්නේ කුමන අවස්ථාවේදීද?

(iii) ගිහානි ඉ- බැංකු පද්ධතියක ලියාපදිංචි වී ඇත. මාර්ගගත සාප්පු සවාරි (online shopping) වලදී ඇය මේ පහසුකම භාවිත කරයි.
a. මාර්ගගත සාප්පු සවාරි මගින් ඇයට ලැබෙන වාසි දෙකක් දක්වන්න.
b. ඉ- බැංකු පද්ධතියකින් ලැබෙන වෙනත් පහසුකම් දෙකක් දක්වන්න.

**(5)** මහවැලි විද්‍යාලයේ අදායම් වාර්තාවක් පහත පැතුරුම්පත් කොටසින් දැක්වේ. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ක්‍රීඩා උත්සවයේ වියදම් සඳහා එක් එක් නිවාසය සිසුන්ගෙන් මුදලක් එකතු කරනු ලබන අතර එක් නිවාසයක එකතු වන මුළු මුදලින් 10%ක දායකත්ව ප්‍රතිශතයක් පාසලට ලබා දිය යුතුය.

| | C | D | E | F | G | H | I |
|---|---|---|---|---|---|---|---|
| 3 | | | | ක්‍රීඩා උත්සවය - 2019 ආදායම් වාර්තාව | | | |
| 4 | දිනය | නිවාස නාමය | ශිෂ්‍ය සංඛ්‍යාව | සිසුවෙකුගෙන් අය කරන මුදල | මුළු මුදල | පාසලට දායකත්වය | පසු දායකත්ව මුදල |
| 5 | 2019-01-05 | හංස | 1040 | Rs.100.00 | Rs.104,000.00 | Rs.10,400.00 | Rs.93,600.00 |
| 6 | 2019-01-10 | ලිහිණි | 1030 | Rs.100.00 | Rs.103,000.00 | Rs.10,300.00 | Rs.92,700.00 |
| 7 | 2019-01-14 | මියුර | 1025 | Rs.100.00 | Rs.102,500.00 | Rs.10,250.00 | Rs.92,250.00 |
| 8 | 2019-01-16 | පරවි | 1035 | Rs.100.00 | Rs.103,500.00 | Rs.10,350.00 | Rs.93,150.00 |
| 9 | | මුළු ආදායම | | | | | **Rs.371,700.00** |
| 10 | දායකත්ව ප්‍රතිශතය | | 10% | | | | |

(i) හංස නිවාසයේ එකතුවී ඇති මුදල සෙවීමට G5 කෝෂයට ලිවිය යුතු සූත්‍රය කුමක්ද?

(ii) දායකත්ව ප්‍රතිශතය E10 කෝෂයේ දක්වා ඇත. එක් එක් නිවාසය පාසලට ලබා දෙන දායකත්ව මුදල ගණනය කරන්නේ සිසුන් ගෙන් එකතු වූ මුදල් ප්‍රමාණය(මුළු මුදල) දායකත්ව ප්‍රතිශතයෙන් ගුණ කිරීමෙනි. හංස නිවාසය පාසලට ලබා දෙන දායකත්ව මුදල සෙවීමට H5 කෝෂය තුල ලිවිය යුතු සූත්‍රය කුමක්ද?


(iii) හංස නිවාසයේ මුළු දායකත්වය සෙවීමට I5 කෝෂයට ලිවිය යුතු සූත්‍රය කුමක්ද?

(iv) මුළු ආදායම(මුළු පසු දායකත්ව මුදල) සෙවීමට I9 කෝෂයට ලිවියයුතු ශ්‍රිතය කුමක්ද?

(v) සංවිධායක කමිටුව විසින් දායකත්ව ප්‍රතිශතය 12% දක්වා වැඩි කිරීමට තීරණය කරන ලදී. කුමන කෝෂ වෙනස් විය යුතුද?

(vi) නිවාසයේ නම හා පසු දායකත්ව මුදල දැක්වීමට සුදුසු ප්‍රස්ථාර වර්ග දෙකක් සඳහන් කරන්න.

**(6)** පහත ගැලීම් සටහන මගින් නිරූපිත ඇල්ගෝරිතමය, සංඛ්‍යා 5ක් කියවා ඒවායේ ඓක්‍යය මුද්‍රණය කරනු ලැබේ.




(i) ඉහත ගැලීම් සටහන නිවැරදිව ක්‍රියාත්මක වීම සඳහා A සහ B ලේබල සඳහා ප්‍රතිස්ථාපනය කළ යුතු වගන්ති ලියා දක්වන්න.

(ii) ඉහත දැක්වෙන ගැලීම් සටහනට අනුරූප ව්‍යාජ කේතය ලියන්න.



LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
විද්‍යාව
A9+
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
G.C.E. O/L
සිංහල
A9+
G.C.E. O/L SINHALA
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON
DELIVERY
HOME
DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440

LOL.LK Learn Ordinary Level

All | Search Books Here... | Search

Hotline 071 777 4440 | 0 | Log in Register

Shop By Grade | Home | Shop | Contact Us

Grade 1 | Grade 2 | Grade 3 | Grade 4 | Grade 5 | Grade 6 | Grade 7 | Grade 8 | Grade 9

Grade 10 | Grade 11 | G.C.E O/L | Grade 12 | Grade 13 | G.C.E A/L | GOVERNMENT EXAMS

## O/L Past Paper Books

English Medium | Sinhala Medium | View All




O/L English language Past Paper Book – Master Guide

රු 900.00

or 3 X රු**300.00** with mintpay




O/L Sinhala Language Past Paper Book – Master Guide

රු 850.00

or 3 X රු**283.33** with mintpay




O/L History Past Paper Book – Master Guide

රු 900.00

or 3 X රු**300.00** with mintpay




O/L Mathematics Past Paper Book – Master Guide

රු 850.00

or 3 X රු**283.33** with mintpay




O/L Science Past Paper Book – Master Guide

රු 850.00


or 3 X රු**283.33** with mintpay




O/L Buddhism Past Paper Book – Master Guide

රු 750.00


or 3 X රු**250.00** with mintpay




O/L Second Language Tamil Past Paper Book – Master Guide

රු 700.00

or 3 X රු**233.33** with mintpay




O/L Second Language Sinhala Past Paper Book – Master Guide

රු 800.00

or 3 X රු**266.67** with mintpay




O/L Design And Mechanical Technology Past Paper Book – Master Guide

රු 650.00

or 3 X රු**216.67** with mintpay